# ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය හා ඒ ආශ්‍රිත අනෙකුත් ගොඩනැගිලි සඳහා ආරක්ෂක සේවා සැපයීම

කොන්ත්‍රාත් අංකය : **ID/HO/CT/Security/NCB/2023/09**

01. සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් පහත සේවාවන් සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

වගුව - 01

| කොන්ත්‍රාත් අංකය | කාර්ය විස්තරය | ලංසු වලංගු කාලය | ලංසු සුරක්ෂණ සහතිකයේ වටිනාකම (ශ්‍රී ලංකා රුපියල්) | ලංසු සුරක්ෂණ සහතිකය වලංගු කාලය |
|---|---|---|---|---|
| **ID/HO/CT/Security/ NCB/2023/ 09** | වාරිමාර්ග ප්‍රධාන කාර්යාලය හා ඒ ආශ්‍රිත අනෙකුත් ගොඩනැගිලි සඳහා ආරක්ෂක සේවා සැපයීම | 2024-03-01 දින දක්වා | **150,000.00** | 2024-03-29 දින දක්වා |

**02.** ඉහත සඳහන් සේවා සැපයීම් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලංසු ලිපිලේඛන අදාල ආයතනයේ ලිපි ශීර්ෂයක් මගින් අයදුම් කර රු.**3,500.00** ආපසු නොගෙවන ගාස්තුව ලංකා බැංකුවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින් ක්‍රියාත්මක වන ගිණුම් අංක **7042385** වෙත තැන්පත් කොට [මාර්ගගත මුදල් තැන්පත් කිරීම (**Online Transfers**) භාර ගනු නොලැබේ.] **2023-11-23** දින සිට **2023-12-14** දින දක්වා රජයේ වැඩ කරන දින වලදී පෙ.ව. **9.00** සිට ප.ව. **2.30** දක්වා කොළඹ **07**, බෞද්ධාලෝක මාවතේ, අංක **230** දරන ස්ථානයේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, දෙවන මහලේ, කාමර අංක **216** ලිපිනයේ වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැක.

**03.** මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන අංකය: **011-2582897** හෝ **011-2583305**) වැඩිදුර තොරතුරු ලබාගත හැක.

04. මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් හා වැඩබිම් චාරිකාවක්, පහත වගුවේ සඳහන් පරිදි සිදු කෙරේ. අපේක්ෂිත ලංසුකරුවන් අදාළ නිලධාරීන්ගේ සහයෙන් එම වැඩබිම් පරීක්ෂා කොට බලන ලෙසට ඉල්ලීමක් කෙරේ.

වගුව - 02

| වැඩබිම් චාරිකාවට සහය වන ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | වැඩබිම් චාරිකා දිනය/ වේලාව හා ආරම්භක ස්ථානය | පෙර ලංසු හමුව පැවැත්වෙන දිනය/ වේලාව හා ස්ථානය |
|---|---|---|
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු (ගොඩනැගිලි හා ගොඩනැගිලි සේවා) දුරකථනය **011-2581802** | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය (ගොඩනැගිලි හා ගොඩනැගිලි සේවා) **2023-11-30** දින පෙරවරු **10.00** ට | කොළඹ 07, බෞද්ධාලොක මාවත, කාමර අංක **318**, වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා) කාර්යාලය - **2023-12-01** දින පෙරවරු **11.00** ට |

**05.** ඉදිරිපත් කරන සියළුම ලංසු ඉහත වගුව - **01** හි සඳහන් වටිනාකම සහිත ලංසු සුරක්ෂණ සහතිකය සමග (අදාල ආකෘතිය අනුව) ඉදිරිපත් කල යුතු අතර, එසේ ඉදිරිපත් නොකරන ලංසු අසම්පූර්ණ ලෙස සලකා කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06.** ලංසුවට අදාල සියළුම ලිපිලේඛන වල ලංසු ඉදිරිපත් කරන අය / ආයතනයේ බලයලත් අය අත්සන් කර ආයතනයේ සහ පෞද්ගලික මුද්‍රාවද තැබිය යුතුය.

**07.** සම්පූර්ණ කරන ලද ලංසු **2023-12-15** දින පැය **10.00** (පෙව.**10.00**) ට හෝ ඊට පෙර ලැබෙන පරිදි කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 230 හි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ **3** වන මහලේ කාමර අංක **311** හි (ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ කාමරය) මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව" වෙත ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. ලංසු භාරගැනීම **2023-12-15** වන දින පැය **10.00** (පෙව.**10.00**) ට අවසාන වන අතර, ඒ වහාම විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ප්‍රසම්පාදනයේ නම සහ ප්‍රසම්පාදන අංකය (**IFB No.**) සඳහන් කල යුතුය.

**08.** ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

**09.** එක් ලංසුවක් හෝ ලංසු කීපයක් හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,

අංක 230, බෞද්ධාලෝක මාවත,

කොළඹ 07.

දිනය : **2023-11-23**